1. හැඳින්වීම

   I. මූලික තොරතුරු

      a) වසම හා අංකය: 486 එෆ් හෝමාගම දකුණ
      b) වපසරිය ($km^2$ හා අක්කර හා හෙක්ටයාරවලින් ) අක්කර 150 හෙක්ටයාර් 375
      c) ප්‍රා ලේ කොට්ඨාසය ; හෝමාගම
      d) ගොවිජන හා කෘෂිකර්ම කොට්ඨාසය: හෝමාගම
      e) සෞ වෛ නි කොට්ඨාසය: හෝමාගම
      f) පශු වෛ නි කොට්ඨාසය: හෝමාගම
      g) බීට්ටු වන කාර්යාල කොට්ඨාසය: කළුතර
      h) අඩවි වන කාර්යාල කොට්ඨාසය: වග
      i) වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය: කොළඹ

   II. ජනගහණය (විමර්ශන හා උපුටාගැනීම් දැක්විය යුතුය)
      ස්ත්‍රී :1945
      පුරුෂ:1726
      එකතුව:3671
   III. ජනාවාසකරණයේ ස්වභාවය (ග්‍රාමීය/නාගරික/අර්ධනාගරික/වතු...): අර්ධ නාගරික
   IV. දේශගුණික තොරතුරු

      a) අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම
         අක්ෂාංශ:80.00
         දේශාංශ :6.84
      b) උෂ්ණත්වය (සාමාන්‍ය/උපරිම/අවම)
         සාමාන්‍ය:30.68c
         උපරිම :32c
         අවම :29.8c
      c) වර්ෂාපතනය (mm): 390mm
      d) සාපේක්ෂ ආර්ද්‍රතාව:33%

   V. පාංශු තොරතුරු

      a) පසේ ස්වභාවය: සියුම් වයනය
      b) පසේ වර්ගය:
         රෙඩ් යෙලෝ පොලිසොලික්
      c) සුලබ පාෂාණ ස්ථිත්වය (ග්‍රැනයිට්/ග්‍රැෆයිට්/ෆෙල්ස්පාර් ආදිය):ගැනයිට්

2. පරිසර සම්පත් පැතිකඩක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාව
   I. සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම
   II. තිරසර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම
   III. පාරිසරක ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම
   IV. පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය,සහභාගීත්වය හා අවබෝධය පුළුල් කිරීම
   V. සංවර්ධන යෝජනා හඳුනාගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම
   VI. ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කරගැනීම
   VII. අඛණ්ඩ මෙහෙයුම්කරණය,අධීක්ෂණය හා අගැයීම ස්ථාපිත කිරීම

3. ස්වභාවික සම්පත් පැතිකඩ
   I. භෞමික සම්පත්

a) වපසරිය/භූමි ප්‍රමාණය (km2 හා අක්කර හා හෙක්ටයාරවලින්) (ඇමිනුම1මගින් දක්වා ඇත)

b) භූමි පරිහරණ සැලසුම

- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය
    i. වී
       වගා කරන: අක්කර 1 රූඩ් 3
    ii. වෙනත් ධාන්‍ය බෝග (ඉරිඟු/මුං/කවුපි ආදිය):අදාල නොවේ.
    iii. අපනයන කෘෂි බෝග (ඇමුණුම 01)
    iv. භූමි යෙදවුම
        1. ගොඩ ඉඩම්: හෙක්ටයා:146.34
        2. මඩ ඉඩම් (ශ්‍රේණිය සහිතව)
           W-අක්කර 2 රූට්1 පර්චස් 29
           A-අක්කර 5 රූට්1 පර්චස් 5
           B-අක්කර 1 රූට් 1 පර්චස් 14
        3. පුරන් වූ /අත්හැර දැමූ:අක්කර 4 රූඩ් 1 පර්චස් 7

c) පසේ ස්වභාවය හා සාඵල්‍යතාව වැලි සහිත පස්-වැඩිපුර වැලි අන්තර්ගතවීම.
හුණුගල් පස්වැඩිපුර ලවන ප්‍රමාණයක් පසෙහි අන්තර්ගත වීම.
තෙතමනය සහිත පස්කාබනික ද්‍රව්‍ය දිරාපත් වීමෙන් සෑදෙන පස
මැටිපස ජලය වැඩිපුර රඳවා තබා තබාගන්නා ා පසු ගල් සහිත පස්සේ පාෂාණ හා ගල් වලින් පිරී ඇතිවීම
පසේ ස්වභාවය පාරිසරික තත්ත්වයන් අත රඳා පවතී දේශගුණය කාලගුණය එහි ජීවත්වන ජීවීන් අනුව පසුව ස්වභාවය වෙනස් වේ. ඒවායේ ප්‍රභවය උෂ්ණත්වයසාරවත් බව පී.එච් අගය යන සාධක පසෙක ස්වභාවය තීරණය සඳහා බලපානු ලබයි.

d) පාංශු බාදනයේ ස්වභාවය:භූමියක මතුපිට භූමියක මතුපිට පිහිටි පස් තට්ටුව ඒවා බිහි වූ ස්ථානයෙන් වෙන් වී වෙනත්ස්ථානයක තැන්පත් වීම පාංශු කාදනය ලෙස හැඳින්විය හැක.හෝමාගම දකුණ වසම ගත්කල කල පාංසුබාදනය ක්‍රම කිහිපයක් ඔස්සේ සිදුවේ එනම් ස්වභාවිකව සිදුවන පාංශු බාදනයහා මිනිස් ක්‍රියාකාරකම් මත සිදුවන පාංසුබාදනය ලෙස දැක්විය හැක.හෝමාගම දකුණ වසන පිළිබඳ සැලකීමේදී අධික වර්ෂාව පවතින විට පසු මතුපිටින් ජලය ගලා යෑම මගින් පාංශු බාදනය සිදුවේ උදාහරණ ලෙසඉඹුලකන්ද ප්‍රදේශයේ දැක්විය හැක.

e) පාංශු හායනයේ ස්වභාවය:
දීර්ඝ කාලයක් තුළින් පසේ ගුණාත්මක භාවය ක්‍රම ක්‍රමයෙන් අඩුවී යාම පාංසු හායනය වේ.අවිධිමත් වගා ක්‍රම භාවිතය අවිධිමත් ලෙස කුණු කසල බැහැර කිරීම හා පොහොර යෙදීම හා  නිසාද පාංසු හායනය සිදුවිය හැක.හෝමාගම දකුණ වසමෙහි ස්ථාන කිහිපයක මෙසේ අවිධිමත් ලෙස කුණු බැහැර කිරීම දැකගත හැක.

II. ජලජ සම්පත්

a) මතුපිට ජල මූලාශ්‍ර

- ගංගා-අදාළ නොවේ.
- අතු ගංගා /ඔය/දොළ-අදාළ නොවේ.
- ඇල මාර්ග: *වැවේ දෙනියේ යාය දකුණු පිට ඇළ-700m
  *මායිම් ඇල-750m
- වැව් /තටාක:අදාළ නොවේ.
- පොකුණු/ නිර්මිත පොකුණු (අත්හළ ගල්වල)හෝමාගම දකුණ වසමෙහි අත්හළ ගල්වලවල් 5ක් හඳුනා ගත හැක.
  සමස්ත භූමි ප්‍රමාණය අක්කර 2.5
- දිය උල්පත්අදාළ නොවේ.

b) භූගත ජලය

- ළිං -236
- නළ ළිං-02

  (2024 සම්පත් පැතිකඩ ආශ්‍රයෙන්)

c) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යන්‍ය වර්ෂාපතනය (mm)-390mm
- වර්ෂා ක්‍රමය (මෝසම්/සංවහන): හෝමාගම දකුණ වසමට බලපානු ලබන්නේ නිරිත දිග මෝසම් වර්ෂාවයි.මෙහි ලක්‍ෂණය වන්නේ කෙටි කාල පරාසයක් තුළ විශාල වර්ෂාවක් පතිත වීමයි.මෙම වර්ෂයේ හෝමාගම දකුණ ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු සඳහාප්‍රමාණවත් වර්ෂාපතනයක් නිරතදිග මෝසම්පූර්ණ වර්ෂාව මඟින් ලැබුණි.

මීට අමතරව ඔහු මගම දකුණ ප්‍රදේශයට වර්ෂාව ලැබෙන අනෙකුත් වර්ෂා ක්‍රමය වන්නේ සංවහන වර්ෂාවයි.තද හිරු රැස් ඇති දිනවල දහවල් කාලයේදී ඇති වන සංවහන වායු ධාරා නිසා අහස බලාකුළුවලින් බර වී සවස් කාලයේඇතිවන ගිගුරුම් සහිත වැසි සංවහන වැසි නම් වේ.මාර්තු සිට අප්‍රේල් කාල වකවානුව හා සැප්තැම්බර් සිට ඔක්තෝම්බර් කාල වකවානුව මෙම සංවහන වැසි බලපානු ලබන කාල පරාසය වේ.

d) වාරිමාර්ග කටයුතු

- මහා වාරි ව්‍යාපාර-අදාළ නොවේ.
- සුළු වාරි ව්‍යාපාර-අදාළ නොවේ.

e) ජලයේ ගුණාත්මකබව-ph6.5-7.5

f) ජල සුලබතාව-

මිනිසාගේ පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය වන සාධකයක් වන ජලය 80% හෝමාගම දකුණු ප්‍රජාව සපයා ගනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මගින් වන අතර 20%ලින් මඟින් ජල අවශ්‍යතාවය සපුරා ගනී.

වසමෙහි ඉඹුලකන්ද ප්‍රදේශයෙහි පවුල් 13ක ජනතාව පානීය හා අනෙකුත් ජල අවශ්‍යතා සපුරා ගනුලබන්නේ ප්‍රජා ජල ව්‍යාපෘතියක් මගින් වන අතර එය ප්‍රමාණවත් ජල තෙර කුමක් ඔස්සේ නොලැබීම මතක් එම ප්‍රතිලාභීන් අපහසුතාවයට පත්ව සිටීම හඳුනාගත හැකි ගැටලුවකි.

III. වනාන්තර හා වනවගාවන්

a) වන වැස්මේ වපසරිය (km2 හා අක්කර හා හෙක්ටයාරවලින්)වනාන්තර ලෙස සැලකෙන භූමි ප්‍රමාණ හෝමාගම දකුණු වසමෙහි නොමැත.

b) සුලබ ශාක පිළිබඳ ලේඛනය

හෝමාගම දකුණ වසමෙහි සුලභය ශාක ලෙස පොල්, කොස්, කෙසෙල්, අඹ, රඹුටන්, පුවක්දැක්විය හැක.

c) දැවමය නොවන වන නිෂ්පාදන (NTFPs)

- ආහාර හා ආකලන

  ආහාර ලෙස කොස්, දෙල්, පොල්, කෙසෙල්, කෝපි, පුවක් දැක්විය හැක.

  ආකලන ලෙස ගම්මිරිස්, කරපිංචා, කහ, රම්පේ, ඉඟුරු, මිරිස් දැක්විය හැක.
- දේශීය ඖෂධ

  දේශීය ඖෂධ ලෙස ගෙවතු මට්ටමෙන් වගා කර ඇති ශාක වන කහ, නික, පාවට්ටා, බෙලි, කෝමාරිකා, කරපිංචා, කොහොඹ, රණවරා, හාතාවාරිය, බැබිල ආදිය දැකගත හැක.
- ශාකසාර (රෙසින්/තෙල්/ලාටු/මැලියම් ආදිය)අදාල නොවේ.
- අත්කම් අමුද්‍රව්‍ය (වේවැල්/හණ/පට්ට ආදිය)-අදාළ නොවේ.

- ඉදිකිරීම් අමුද්‍රව්‍ය- හෝමාගම දකුණ වසම තුළ ඉදිකිරීම් අමුද්‍රව්‍යයක් වන කළුගල් ආශ්‍රිත කර්මාන්තශාලා කිහිපයක්ඇත. ඒ අතර කළුගල් ඇඹරීමේ කර්මාන්තශාලා, පෙරමුසු කොන්ක්‍රීට් නිෂ්පාදන කර්මාන්තශාලා, ග්‍රනයිට් කර්මාන්තශාලා, කළුගල් කැට කිරීමේ/ කළුගල් කැබලි කිරීමේ කර්මාන්තශාලා පිහිටා ඇත.
- සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත ද්‍රව්‍ය- හෝමාගම දකුණ වසම තුළින් මධ්‍යම පරිමාණ ඕකිඩ් වගා උයනක් පිහිටා ඇත.

d) වන විනාශකිරීම් පිළිබඳ විස්තරය-වාර්තා නොවේ.

e) වනවගා ව්‍යාපෘති විස්තරය-නොමැත.

f) වන සංරක්ෂණ ප්‍රයත්නයන්

- ප්‍රජා වැඩසටහන්- නොමැත.
- රාජ්‍ය/රාජ්‍ය නොවන/ ස්වේච්ඡා සංවිධාන මඟින්- නොමැත.

IV. ජෛව විවිධත්වය

a) ශාක ලේඛනය (විශේෂය වශයෙන්)

b) ශාක වර්ගීකරණය (දේශීය/ඒකදේශීය/හඳුන්වාදුන් විදේශීය හෝ දේශීය/ස්වභාවීකෘත විදේශීය හෝ දේශීය/ආගන්තුක/ආගන්තුක-ආක්‍රමණශීලි වශයෙන්) (ප්‍රස්තාර සහිතව)

දේශීය ශාක: කොහොඹ කොස් වෙරළු දවට

ඒක දේශීය ශාක:

ගොරක

හඳුන්වා දුන් දේශීය/ විදේශීය ශාක;

තේක්ක, ගිනිකූරු, පොල්,කුඹුක්

ආක්‍රමණශීලී ශාක:

මාන, ගඳපාන

c) අන්තරායට ලක්වූ කාණ්ඩ (CR/EN/VU-IUCN) (ප්‍රස්තාර සහිතව)

4. පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

I. කෘෂිකර්මය

a) ප්‍රධාන භෝග (වී)- ඇමිනුම 3 දක්වා ඇත.

b) අතිරේක භෝග (ධාන්‍ය හා ආහාර බෝග වර්ග)-නොමැත.

c) අපනයන භෝග (තේ/පොල්/රබර්)-

පොල්- අක්කර10

තේ හා රබර් වසම තුළ නොමැති අතර පොල් වගාව සීමිත ඉඩම් කිහිපයක පමණක් පවතී. ඉඩම් සීමිත වීම හා ජන සංඛ්‍යාව වැඩිවීම, එකම බිමක දීර්ඝකාලීනව වගා කිරීම මත ඵලදාම අඩුවීම ආදිය පොල් වගාවෙහි අවම තත්ත්වයක් ඇතිවීමට හේතු වී ඇත.

d) සුළු අපනයන භෝග /අපනයන කෘෂි බෝග (ඇමුණුම 01)

වගා බිම් වශයෙන් මෙම සුළු අපනයන භෝග බහුලව වසමෙහි දක්නට නොමැති අතර ගෙවතු ආශ්‍රිතව පහත සඳහන් ප්‍රභේදයන් සුළු ප්‍රාමාණිකව දැක ගත හැක.

ගම්මිරිස්- පර්චස් 2

පුවක්- පර්චස් 0.5

කරාබු නැටි- පර්චස්0.5

e) වෙනත් වානිජ භෝග (පාම්/අගාවුඩ් ආදිය) -වසමෙහි නොමැත.

f) රසායනික පොහොර යෙදවුම (ප්‍රස්තාර සහිතව)- ප්‍රස්ථාර මඟින් ඉදිරිපත් කර ඇත.

g) කෘමි/පළිබෝධනාශක යෙදවුම (ප්‍රස්තාර සහිතව)- ප්‍රස්ථාර මගින් ඉදිරිපත් කර ඇත.

h) නූතන කෘෂිකාර්මික පිළිවෙත්:

නූතනයේ දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හා බැදි පහසු හා කාර්යක්ෂම කෘෂිකාර්මික වත් පිළිවෙත් සඳහා යොමුව තිබීම දැකගත හැක.

අතීතයේ දිවගාව සඳහා යොදාගත් සතුන්ගෙන් බැහැරව මේ වන වනවිට පහසු යන්ත්‍රෝපකරණ මගින් වී ගොවිතැනෙහි නියැලීම එයට උදාහරණයකි. ගොයම් පැළ

සිටුවීම සඳහා පැරැසුට් ක්‍රමවේදය, බීජ වප්කරය මගින් පැළ සිටුවීම නවීන ක්‍රමෝපායන් වේ.

- බෝග මගින් ලබාගන්න ලබාගන්න අස්වැන්න වඩා වර්ධනය කර ගැනීම සඳහා රසායනික පොහොර භාවිතය, කෘමිනාශකයේදීම.

- නවීන තාක්ෂණය මගින් මිනිස් ශ්‍රමයෙන් බැහැරව යන්ත්‍රෝපකරණ බහුලව භාවිතා කිරීම තුළ කාර්යක්ෂමතාව අපේක්ෂා කිරීම.

i) සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්:

මුල් මුල්කර ගොවිතැන ගත් කෘෂිකාර්මික සමාජ ආර්ථික රටාවක් පැවැති අතීත සමාජයේ ඒ ආශ්‍රිත විවිධ විශ්වාස හා ඇදහිලි සහිත ජීවන වෘත්තියක් ලෙස විවිධ පත් පිළිවත් වලට යොමුව තිබුණි.

ඒ තුළ සම්ප්‍රදායික කෘෂි පිළිවෙත් පිළිබඳව විමසීමේදී ගොවිතැන සරු කර ගැනීම වස් සතුන්ගේ මල ගස්වල පොතු කොම්පෝස්ට් ආදී පරිසරය තුළින්ම සපුරා ගත හැකි දේ ගොවි බිමට යෙදීමට පුරුදුව සිටියහ.

ජලයේදීම සඳහා වක්කඩ වගාලින් ආදිය යොදා ගැනීම ද එකල බහුලව වගාව සඳහා යොදාගත් ජල සම්පාදන ක්‍රමයක ක්‍රමයකි. නූතනය වන විට මෙම ක්‍රමයන්ගෙන් සම්පූර්ණයෙන්ම මිදී නූතන දියුණු කෘෂිකාර්මික පිළිවෙත් ගොවිබිම වෙත අනුගත කරගෙන තිබීම හඳුනාගත හැක.

j) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP)-

කෘෂි කර්මාන්තය සඳහා නූතනයේදී පවා යොදා ගනු ලබන සම්ප්‍රදායික හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් මගින් ගොවි ජනතාව යහපත් ප්‍රතිඵල හෙවත් ඵලදාවඅපේක්ෂා කරනු ලබයි.ඒ අතර: -කාබනික පොහොර භාවිතය

- ස්වභාවික හා පාරිසරික අමුද්‍රව්‍ය පළිබෝධනාශක ලෙස යොදා ගැනීම.

-පාරිසරික හා දේශගුණික කාලගුණික තත්ත්වයන්ට අනුගත වෙමින් කෘෂිකාර්මික කටයුතු වල නියැලීම.

k) කෘෂිකර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා (ස්වභාවික ආපදා/කෘමි හා පළිබෝධ බලපෑම්)-

- විවිධ පරිසර තත්වයන් ඔස්සේ කෘෂිකර්මාන්තය සඳහා බලපාන නියන් තත්ත්වයන්, ගංවතුර හා ජලගැලීම් තත්ත්ව

- කෘමි සතුන්ගෙන් වන වගා හානි හා ඒවට අදාළ විශාල වගා පරිශ්‍රමයන් දැරීමට සිදුවීම.

- නව රෝග ව්‍යාප්තීන්වලට මුහුණ දීමට සිදුවීම.

- පොහොර, බීජ, කෘමිනාශකවල හිඟතාවය හා විශාල වශයෙන් මිල ඉහළ යාම.

- වී වගාව පිළිබඳ විමසීමේදී පැළ මැක්කන් ඇතිවීම, පැළ දුඹුරු පාට වීම, දුඹුරු පැල ක්‍රීඩාවන් ඇතිවීම, පුරන් කුඹුරු තිබීම, එසේම කුඹුරුවලට අදාළ ශ්‍රමය ලබා ගැනීමට අසීරුවීම.

II. පශු සම්පත් කර්මාන්ත

a) සුලබ පශු කර්මාන්ත යෙදවුම් (ගව/මීගව/එළු/කුකුළු/වෙනත්)
(වගුවක් සහිතව ඉදිරිපත් කර ඇත)
සීමිත ඉඩම් පරිහරණයක් පවතින මෙම වසම තුළ ගොවීන් පසු පාලනයද අවමව සිදු කරනු ලබයි. පවුල් පරිභෝජනය සඳහා කිරි ලබා ගැනීමෙ අරමුණින් එළහව, මී ගව, එළුවන් ආදී සත්වයින්ද බිත්තර ලබා ගැනීමේ අරමුණින් කුකුල් පාලනයෙහිද නිරතවීම සිදුකරනු ලබයි.

b) පශු කර්මාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබද විස්තරය (ස්වාභාවික/කෘත්‍රිම/මිශ්‍ර)
(වගු සහිතව ඉදිරිපත් කර ඇත)

c) පශු වෛද්‍යමය සාධක (රෝග ආදිය)
ගවයන්, එළුවන් - කුර රෝග, මුඛ රෝග
කුකුළන් - කුරුලු උණ

III. ධීවර කර්මාන්තය

a) ප්‍රධාන ධීවර අයිතම (මත්ස්‍ය වර්ග)

b) ධීවර කාර්මික පරිවාර (සම්ප්‍රදායික බිලිබෑම/දැල් දැමීම/නවීන ක්‍රම ආදිය)

c) ධීවර කර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා- අදාල නොවේ.

IV. ශක්ති ප්‍රභව

a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය (ප්‍රස්තාර සහිතව)-( ප්‍රස්ථාර සහිතව ඉදිරිපත් කර ඇත)

- පුනර්ජනනීය ශක්ති ප්‍රභව-

  ජල විදුලිය, සූර්ය බලය, ජීවවායු

  වසමෙහි බහුතරයක් පිරිස පුනර්ජනනීය බල ශක්ති ප්‍රභවයන් ලෙස ජල විදුලිය උපයෝගී කරගන්නා අතර සුළුතරයක් සූර්ය බල ශක්තිය උපයුක්තසූර්ය පැනල මගින් විදුලි බලය ලබා ගනී ගනී මෙම ශක්ති ප්‍රභවය සඳහා වැය වන අධික පිරිවැය මත බොහෝ පිරිසක් මේ සඳහා යොමුනොවේ එහෙත් වර්තමානය වන විට පෙරට සාපේක්ෂව යම් නැඹුරු තාවයක් මේ සඳහා ජනතාව තුළ තිබෙනු හඳුනාගත හැකිය.

  හෝමාගම දකුණ වසම තුළ ජීව වායු හෝ සුළං ප්‍රභවය මුල් කරගත් පුනර්ජනනීය ශක්ති ප්‍රභවයන් භාවිත පිරිස් නොමැත.

- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව-

  ගෑස්, ඛනිජ තෙල්,භූමි තෙල්

  අර්ධ නාගරික පරිසර රටාවන්ට අනුගත පිරිසක් වෙසෙන හෝමාගම දකුණු වසන තුළ ගෑස් භාවිතය බොහෝ පිරිසක් තම පහසුව හා කාර්යක්ෂමතාවය මත භාවිත කරනු ලබන අතර පණිජ තෙල් හා භූමිතෙල් භාවිතය අවම මට්ටමක පවතී.

b) ස්වභාවික ශක්ති සම්පත් කොරහි වන ඉල්ලුම හා සැපයුම් අනුපාත විශ්ලේෂණය (ප්‍රස්තාර සහිතව)

ප්‍රස්ථාර සහිතව ඉදිරිපත් කර ඇත

c) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවේ දායකත්වය

මෙම වසම තුළ පුනර්ජනනීය ශක්ති ප්‍රභවයේ යෙදවුම් සඳහා වැඩි නැඹුරු තාවයක් නොමැති අතර ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුව තිබීම මීට හේතුපාදක වී ඇත.

5. සමාජ-සංස්කෘතික සන්දර්භය

I. පරිසර ගැටළු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණ යන්ත්‍රණය

සාම්ප්‍රදායික සරල සාමකාමී ජීවන රටාවන්ගෙන් මිදී පුළුල් හා සංකීර්ණ ජීවන රටාවකට පරිවර්තනය වීමත් සමග පුළුල් අවශ්‍යතා සපුරා ගැනීමට යාමේදී මිනිසා මගින් පරිසරයටසිදුවූ අතිමහත් විනාශකාරී තත්ත්වයන් මේ වන විට දරා ගත නොහැකි මට්ටමක් දක්වා වර්ධනය වී ඇත මිනිසාගේ පැවැත්ම සඳහා හඳුනාගත් එම පරිසර ගැටලුකාරී තත්ත්වයන්ගෙන් මිදීම සඳහා විවිධ විසඳුම් හා විකල්ප යෝජනා ඔවුන් විසින් මේ වන විට ඉදිරිපත් කරමින් හා ක්‍රියාත්මක කරමින් පවතී.

- කසල ප්‍රතිචක්‍රීකරණය මගින් විවිධ පරිසර හිතකාමී නිමැවුම් සිදු කිරීම.

-කාබනික පොහොර භාවිතය සඳහා වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබීම.

- පරිසර දූෂණය පාලනය කිරීමට අදාලව විවිධ නෛතික සිද්ධාන්ත ඇති කිරීම.

- සාමකාමී, සරල, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට අදාළ වන පරිසර හිතකාමී පිරිසක් ඇති කිරීම සඳහා අදාළ උපදේශනයක් නිරන්තරයෙන් සිදුකිරීම.

II. සම්ප්‍රදායික පරිසර දැණුම හා පරිචාර

a) ජනප්‍රවාද

ශ්‍රී ජයවර්ධන පූර්ව කෝට්ටේ රාජධානී කරවූ සිරිපැරකුම්බා රජුගේ බිසව වූ බ්‍රාහ්මණ වංශය කුලකුණේ දේවිය විසින් සිය ආගමික කටයුතු සඳහා බ්‍රාහ්මණයන් මෙරටට ගෙන්වූ අතර ඔවුන් පදිංචි වූ ගම බ්‍රාහ්මණගම විය බ්‍රාහ්මණයන් සිය ආගමික කටයුතු සඳහා යාගෝම කිරීමට ගිය ගම හෝමාගම ලෙස නම් කර ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

b) ජනශෘතිය- නොමැත.

c) දේශීය වෛද්‍ය ක්‍රම

සාම්ප්‍රදායික ගැමි සමාජයේ භාවිත සරල දේශීය වෛද්‍යකම වර්තමානයේදීත් අඩු ප්‍රවණතාවයකින් යුතු භාවිතා කරනු ලබන අතර සංකීර්ණ ජීවන රටාවත් සමඟ බහුතර පිරිසක් බටහිර වෛද්‍ය ක්‍රමයන් අනුගමනය කිරීමට පෙළඹී තිබීම දැකගත හැක.

III. සම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිවරණය

අදාළ නොමැත.

IV. පරිසර ගැටළු සඳහා යෙදුණු විසඳුම්/විකල්ප

- රසායනික පොහොර භාවිතය අවම කර හැකි සෑම අවස්ථාවකම විකල්ප පොහොර භාවිතය සඳහා යොමුවීම.
- සීමිත ඉඩම් සීමාව තුළ අවම ඉඩකඩ සහිත ජීවන රටාව මගින් බැහැර කරන කසල කළමනාකරණය සඳහා අදාළ දැනුම ලබාදී ඒ සඳහා යොමු කිරීම.
- යහපත් කසල බැහැර කරන රටාවක් ඔස්සේ කසල වර්ගීකරණය මගින් බැහැර කිරීමට යොමු කිරීම.
- සීමිත ඉඩකඩ ඉඩකඩක ජීවත්වන පවුල් සඳහා කසල බඳුන් සහනදායී මිලට ලබාදීම.
- පුනර්ජනනීය බල ශක්තිය භාවිතය සඳහා යොමු කිරීම හා ඒ සඳහා අභිප්‍රේරණාත්මක හා සහනදායී විසඳුම් ලබාදීම.
- පොලිතීන් ප්ලාස්ටික් භාවිතය අවම ජීවන රටාවකට අදාල විකල්ප පිළිවෙත් හඳුන්වාදීම.

6. කාලීන පාරිසරක අර්බුද හා අභියෝග

I. වන විනාශය /කැළෑ එළිකිරීම- අදාළ නොවේ.

II. ජල හිඟය

වස මෙහි මූලික කේන්ද්‍රස්ථානයතම ස්ථානය ලෙස සැලකෙන ඉඹුලකන්ද ප්‍රදේශයෙහි පවතින ජල හිඟතාවය මෙහිලා දැක්විය හැක.කන්ද මුදුනට ජලය ලබාගන්නේ ප්‍රජා ජල ව්‍යාපෘතියක් මගින් වන අතර එහෙත් අඩු පීඩනයක් ඔස්සේ ජලය ලැබීම මත පවුල් 13 පමණ ජනතාව පීඩාවට පත්ව සිටිති.

එම ජල ටැංකිය වඩාත් උස්මට්ටමක ස්ථානගත කිරීම තුළ වැඩි පීඩනයක් සහිතව කඳු මුදුනෙහි ජනතාවට ජල පරිභෝජනයට ඉඩ සැලසෙන බව නිරීක්ෂණය කර ගත හැක.

III. පාංශු හායනය

පස්සෙහි ph අගය වෙනස්වීම පසේ කාබනික ද්‍රව්‍ය හිඟවීම ක් පාංශු ලවනතාවය වැඩිවීම හා පස තදවීම යන කරුණු පාංශු හායනය නිසා සිදුවන අර්බුද වේ.

IV. කැලි-කසල බැහැරකිරීම

නිවැරදි පිළිවෙතකින් තොරව කසල බැහැර කිරීම තුළ පරිසරයට සිදුව ඇති හානිකර තත්ත්වයන් කිහිපයක් හෝමාගම දකුණ වසම තුළ හඳුනාගත හැකිය.

- හබන් හීනවත්ත වල්ගම පාරේ පිහිටි පොලිස් එක් ආයතනය මගින් බැහැර කරන්නා වූ අපද්‍රව්‍ය ම ස්ථානය අසලින් ගලා බසින කුඹුරු හා ඇළ මාර්ගවලට බැහැර කිරීම තුළු කුරුවා අස්වැද්දීමේදුෂ්කරතාවලට ප්‍රදේශයේ ජනතාව මුහුණ දී සිටිති.
- හබන් හීනවත්ත ගල්බලවල් ආශ්‍රිත අධික දුර්ගන්ධය හා එම ගල්වැල් වල් ජලයෙන් පිරී යාම හා ඒවා ගොඩකිරීමේ අරමුණින් විවිධ අවිධිමත් හා අනවසර කුණු බැහැර කිරීමේරටාව තුළ ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට බලවත් තර්ජනාත්මක තත්ත්වයක් උද්ගතව තිබේ.

V. දේශගුණික විපර්යාසවල බලපෑම

VI. ආගන්තුක හා ආගන්තුක-ආක්‍රමණශීලි විශේෂවල බලපෑම

7. පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කරගැනීම (ඇමුණුම 02)

I. අභිමතාර්ථ අංක 06 - පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

පිරිසිදු පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීමත් නිවැරදි මං පිළිවෙත් ඔස්සේ යහපත් සෞඛ්‍ය පිළිවෙත් මගින් සනිපාරක්ෂාව තහවුරු කර ගැනීම මගින් යහපත් ජීවන රටාවක් ඇතිකර ගැනීම මෙහි මුඛ්‍ය අරමුණ වේ.

සීමිත හා අවම ඉඩකඩක් තුළ පුළුල් හා සෞඛ්‍යාරක්ෂිත ජීවන රටාවක් ගත කිරීමට සිදුවීම තුළ ජලය හා සනීපාරක්ෂාව සුරැකීම මහත් ගැටලුකාරී තත්ත්වයක් ලෙස දැක්විය හැක.අවම ඉඩකඩක් තුළ පිරිසිදු පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමත් වැසිකිළි කැසිකිළි ආදී අවශ්‍යතාවයන් නිවැරදි නිර්ණායක ඔස්සේ සපුරා ගැනීමට ඉඩ ප්‍රස්ථාවසකසා ගැනීමත් අපහසු කාරියක් වී ඇත.

- ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා අප ජලය විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ මුදා හැරීමට අවශ්‍ය උපදෙස් සැලසීම.
- ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ නිවැරදි ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත්භාවය ලබාදීම.
- ජල පිරිපහදු ක්‍රමවේදයන් හා ඊට අදාළ ස්ථානීය අවශ්‍යතා සපුරාලීම.

මෙම ක්‍රමවේදයන් ඔස්සේ;

- සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ඇතිවීම.
- ජලී ගුණාත්මක බව වඩා වර්ධනයය වීම.
- පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් වලට හුරුවීම.

II. අභිමතාර්ථ අංක 07 - ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

දැරණීය හා සුනිත්‍ය බල ශක්තිය ඔස්සේ පුළුල් අවශ්‍යතා හා පුනර්ජනනීය බල ශක්තිය යන ශක්ති ප්‍රභවයන් දරා ගත හැකි මට්ටමින් සපුරා ගැනීමට හැකිවීම පහසුවේ. නිවැරදි ක්‍රමවේදයන් හා අවම පිරිවැයක් මගින් පුනර්ජනනීය ශක්තීන් ලබා ගැනීමට යෝග්‍ය තත්ත්වයන් උද්ගත කරදීම තුළ දරනීය මට්ටමේ විසඳුම් ලබාගත හැක.

III. අභිමතාර්ථ අංක 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

පරිසරය ආරක්ෂා කරමින් හා ස්වභාවික සම්පත් තිරසාරව කළමනාකරණය කරමින් ආර්ථික සංවර්ධනය හා සමාජ සුභසාධනය වැඩි දියුණු කිරීම තිරසාර පරිභෝජනයේ හා නිෂ්පාදනයේ අරමුණ වේ.මිනිසාගේ මූලික අවශ්‍යතාව වන ආහාර සෞඛ්‍ය අධ්‍යාපනය ආදිය ගුණාත්මක හා පරිසර හිතකාමී ලෙස ළඟා කර ගැනීම තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් තුළින් සිදු කරගත හැකිය.

- ප්‍රතිචක්‍රීකරණය සඳහා සුදුසු වැඩපිළිවෙළක් සැකසීම.
- පරිසර හිතකාමී නිෂ්පාදන හා භාණ්ඩ හඳුන්වාදීම.
- රාජ්‍ය හා පෞද්ගලිකාංශය වෙත 3R වැනි සංකල්ප හඳුන්වා දී ඒවා ක්‍රියාවට නැංවීම.
- ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. අභිමතාර්ථ අංක 13 - දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්

ඍජු හෝ වක්‍රව සිදුවන මානව ක්‍රියාකාරකම් වායුගෝල සංයුතියේ ඇතිවෙන වෙනස්කම් හා දේශගුණික විපර්යාස වලට හේතුවේ.

හෝමාගම දකුණ වසම තුළින් කෘෂිකාර්මික කටයුතුවල නියැලෙනව ගොවීන්දුවක් මෙම කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ගේ බලපෑමට මුහුණ දෙති.

V. අභිමතාර්ථ අංක 14 - සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම්දායක භාවිතාව

මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සාගරයට විවිධ රසායනික ද්‍රව්‍ය එකතුවීම මුහුදු හා වෙරළ ප්‍රදේශවල නීති විරෝධී මසුන් ඇල්ලීම ආදී දේ වැළකීම සාගර සම්පත් සංරක්ෂණය හා කළමනාකරණයේ අපේක්ෂිත අරමුණු වේ.

- ප්ලාස්ටික් හා තෙල් රසායනික ද්‍රව්‍ය මුහුදට මුසුවීම මගින් මුහුදු ජීවීන් හා පරිසර පද්ධතියට හානි සිදුවීම.
- ධීවරයින්ට අදාල නෛතික රෙකුලාසි නිසියාකාරව පිළිනොපදීම.
- දේශගුණික විපර්යාස මගින් සාගර ආම්ලීකරණය උණුසුම් වීම හා මුහුදු මට්ටම ඉහළ යාම.

මේ ආකාරයේ විවිධ ක්‍රමවේදයන් මගින් මානවයා විසින් සාගර සම්පත් සංරක්ෂණයට විවිධ බලපෑම් සිදුකරනු ලබයි.

මේ සඳහා විසඳුම් ලෙස තිරසර මසුන් ඇල්ලීමේ පිළිවෙත් ඇති කිරීම ධීවරයින්ට මසුන් ඇල්ලීම සඳහා සීමා නිර්ණය කරදීම ,ක්‍රමවත් හාසුදුසු ධීවර ආම්පන්න භාවිතයට යොමු කිරීම, වෙරළබඩ පරිසර පද්ධතිය සුරැකීම සඳහා නිරන්තර උපදෙස් හා නීති පද්ධතීන් ක්‍රියාත්මක කිරීම, මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව බහුලව භාවිත ප්ලාස්ටික් හා අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම ආදිය මේ සඳහා සුදුසු තිරසාර විසඳුම් වේ.

VI. අභිමතාර්ථ අංක 15 - භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතාව

මිනිස් ක්‍රියාකාරකම් මත සිදුවන පරිසර පද්ධතීන් ක්ෂයවීම අවම කිරීම හා විනාශයටලක් වෙමින් පවතින විශේෂ පරිසර පද්ධතීන් හා සත්ව ගහණයන් ආරක්ෂා කිරීම මෙහි අරමුණ වේ.

- සතුන්ගේ හා ශාකවල හායනයට හේතුවන මානව ක්‍රියාකාරකම් වැළැක්වීම.
- ඉඩම් හායනය වැළැක්වීම
- ජල දූෂණය වැළැක්වීම

- දැනුවත්භාවයන් හා අගයන් ඇති කිරීම ආදිය ඒ සඳහා විසඳුම් ලෙස දැක්විය හැක.
තිරසාර කෘෂිකාර්මික පරිසර පිළිවෙත් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා සංරක්ෂණය කළමනාකරණය කිරීම වැනි කටයුතුවලින් විධිමත් බහුම පරිසර පද්ධතියක් ඇති කළ හැකිය.

8. තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමනාකරණ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස්,යෝජනා හා නිර්දේශ
- ප්ලාස්ටික් පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය වැනි පරිසර හිතකාමී වැඩසටහන් හා උපදේශනයන් මගින් නිරන්තර දැනුවත් කිරීම.
- රසායනික පොහොර හා කෘමි නාශක භාවිතය සීමා සහිතකිරීම.
- නව ඉදිකිරීම් සඳහා ස්ථිරසාර හා ප්‍රමිති කරන නියමයන් හඳුන්වා දීම.
- පුනර්ජනනීය බල ශක්තිය භාවිතය සඳහා ප්‍රජාව දිරිමත් කිරීම හා ව්‍යාපෘති ආරම්භ කිරීමට අදාළ සහාය ලබාදීම.
- පිරිසුදු ජලය හා සනීපාරක්ෂාව ඇති කිරීම සඳහා වසමේ පවුල් ඒකාබද්ධ වන සේ සැලසුම් සකස් කිරීම.
- බොන උන රෝග මගින් ඇතිවන මරණ හා රෝගීන් අවම කිරීමට අදාළ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කසල කළමනාකරණය සඳහා ස්ථිරසාර හා නව ක්‍රමෝපායන් හඳුන්වා දීම යනාදී යෝජනා මේ සඳහා ඉදිරිපත් කළ හැක.

9. ඇමුණුම්

I. සිතියම්
II. රූප සටහන් /කටු සටහන්/චිත්‍ර
III. ප්‍රජා සහභාගීත්ව පර්යේෂණ/සමීක්ෂණ

10. විමර්ශන

11. වසම පිළිබඳ